www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ජනාධිපති අපේක්ෂක විජේ ඩයස්ට ඡන්දය දෙන්න

## Vote for Wije Dias, SEP presidential candidate

**සමාජවාදී සමානතා පක්ෂය**
2010 ජනවාරි 22

**ජ**නවාරි 26 දින පැවැත්වෙන ඡන්දයේදී සිය ජනාධිපති අපේක්ෂක විජේ ඩයස්ට ඡන්දය දෙන ලෙස සමාජවාදී සමානතා පක්ෂය (සසප) සියලු කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටියි. සමාජවාදී ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කරමින් වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා සඳහා සටන් වදින එකම අපේක්ෂකයා ඩයස් පමනි.

මොනතරම් රුදුරු කාකොටා ගැනීම්වල යෙදුනත් බලයේ සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ විරුද්ධවාදියා වන ජෙනරාල් සරත් ෆොන්සේකා යන ප්‍රධාන ධනපති අපේක්ෂකයන් දෙදෙනාට ඇත්තේ එකම මූලික ක්‍රියාමාර්ගයකි. ඔවුන් අතුරින් කවුරු දිනුවත් ඔහු අසාධ්‍ය වෙමින් පවතින ආර්ථික අර්බුදයේ බර, වැඩකරන ජනතාවගේ කර මත පටවමින් ධනවත් ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා ආරක්ෂා කරනු ඇත.

යුද අපරාධ පිලිබඳව දැන් එකිනෙකාට චෝදනා කරගත්තද ඔවුන් දෙදෙනාම මරනය, විනාශය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීම හැරුනු කොට වෙන කිසිවක් අත්කර නොදුන් යුද්ධය සඳහා වගකිව යුතුය. හමුදාව සිවිල් වැසියන් ඝාතනය කරන විටත්, ඝාතක කල්ලි සිය ගනන් මිනිසුන් මරා දමන හෝ අතුරුදහන් කරන විටත්, හමුදා භටයන් විසින් ලක්ෂ දෙක හමාරක් දෙමල මිනිසුන්, ගැහැනුන් හා ලමුන් රැඳවුම් කඳවුරු තුලට දක්කන විටත්, ජනාධිපති සහ ඔහුගේ ඉහලම ජෙනරාල් අතර කිසිදු මතභේදයක් නොතිබුනි.

හමුදාව එල්ටීටීඊය පරාජය කරනු ලැබුවේ පසුගිය මැයි මාසයේදී ය. එහෙත් වැඩකරන ජනතාවට පසුගිය මාස හතේ ලැබුනේ කුමක් ද? රාජපක්ෂ සාමය හා සෞභාග්‍ය සඳහා ප්‍රතිඥා දුන් නමුත් මිල ගනන් පිම්මේ ඉහල නැගුනු අතර ජීවන තත්වයන් පහත වැටුනි. තව ද, රාජපක්ෂ හා ෆොන්සේකා යුද්ධය ගෙනගිය මූර්ග ස්වභාවය තුලින්, නොවරදවාම නව වටයක වාර්ගික ගැටුම් නිර්මානය කරන, වාර්ගික වෛරය දිගින් දිගටම පැලපදියම් වීමේ අන්තරාය මතු කරයි.

මිලිටරි ගැටුම අවසන්ව ඇතත් හදිසි නීතිය හා ත්‍රස්ත විරෝධී කුරිරු අනපනත් ද ඇතුලු සමස්ත පොලිස්-රාජ්‍ය යන්ත්‍රය එසේම පවතියි. වැඩවර්ජිත කම්කරුවන් සාධාරන වැටුපක් ඉල්ලීම අපරාධයක් කොට සලකා ඔවුන්ට එරෙහිව ජනාධිපති දැනටමත් ඔහුගේ හදිසි නීති බලතල යොදාගෙන තිබේ. මැතිවරනයෙන් පසුව එන ආන්ඩුව, සිය න්‍යායපත්‍රයට එරෙහිව යන ඕනෑම විරුද්ධත්වයක් හෝ විවේචනයක් මැඩලීම සඳහා මුලු පොලිස් රාජ්‍ය බලයම යොදාගැනීමට මැලි නොවනු ඇත.

ශ්‍රී ලංකාව "ආසියාවේ විශ්මය" බවට පත්කරම්හයි රාජපක්ෂ සිය මැතිවරන ප්‍රකාශනය තුලින් ප්‍රතිඥා දී ඇත. ඔහු මෙම මනස්ගාතය ගොතාගෙන ඇත්තේ විදේශ ආයෝජකයන් පොලඹවා ගැනීමට මෙන්ම ඡන්දදායකයන් මුලාකිරීමට ය. රාජපක්ෂ කල් තියා මැතිවරනය කැඳවූයේ එලඹෙන මාසවල

දී ආර්ථික තත්වය හොඳ අතට හැරෙනවා වෙනුවට ව්‍යසනකාරී ලෙසින් නරක අතට හැරෙන බව හොඳකාරවම දන්නා බැවිනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් ඩොලර් බිලියන 2.6 නය මුදල සඳහා පනවා ඇති රුදුරු ආර්ථික ප්‍රතිකර්ම වසන් කිරීමේ අරමුනෙන් ඔහු අයවැය පවා මැතිවරනය අවසන් වනතෙක් කල්දැමීය.

ෆොන්සේකා ද එවැනිම ලොකු බොරුකාරයෙකි. රාජපක්ෂ පාලනයේ දූෂනය හා නාස්තිය පිටුදැකීම මඟින් රැකියා, ශුභසාධන, අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් ආදී වසයෙන් සැමදෙනාටම හැමදෙයක් ම සැපයිය හැකි බවට ඔහු පොරොන්දු දෙයි. බංකොලොත් ධනපති ක්‍රමය තුලින් ම පැන නංවා තිබෙන, වැඩකරන ජනතාව මුහුනදෙන ආර්ථික හා සමාජ අර්බුදයේ සැබෑ මූලයන් වසං කිරීම මේ සියල්ලෙහිම අරමුනයි. කොලඹ දේශපාලන සංස්ථාපිතයට ආවේනිකවූ දූෂනය මුල්බැස ඇත්තේ ජනගහනයේ අති මහත් බහුතරයකගේ වියදමෙන් ධනවත් සුලු පිරිසකට වාසි සලසන මේ ආර්ථික පර්යාය තුලම ය.

රාජපක්ෂට හෝ ෆොන්සේකාට සැබෑ ආර්ථික තත්වය පිලිබඳව අවංකව කථා කල නො හැකිය. 1930 ගනන්වලින් පසුව ඇතිවූ නරක ම ගෝලීය ආර්ථික අර්බුදය අවසන්ව නැත. එය නව අදියරකට සේන්දුවී තිබේ. බැංකු හා මහා සමාගම් ගලවා ගැනීමට දැවැන්ත ඇපදීමේ ප්‍රතිඵල වසයෙන් ඩොලර් ට්‍රිලියන ගනනකට නැඟී ඇති නය කන්දරාව දැන් කම්කරු පන්තියේ කර මතට පැටවිය යුතුය. මේ තත්වයට ඔරොත්තු දීම කෙසේ වෙතත්, වසර ගනනාවක් තිස්සේ කල දැවැන්ත මිලිටරි වියදම්වල ප්‍රතිඵල වසයෙන් ශ්‍රී ලංකාව දැවැන්ත ලෙස නයවී තිබේ. නිර්යාත කඩාවැටී තිබේ. රට බංකොලොත් වීමෙන් වලක්වා ගැනීම සඳහා රාජපක්ෂට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් නය ගැනීමට සිදු විය. දැන් ඊට වන්දි ගෙවීමට සිදුව ඇත්තේ කම්කරුවන්ට යි.

පාලක පැලැන්තියේ බලගතු කොටස් ෆොන්සේකාට පිටුබලය දෙන්නේ, අවශ්‍යව ඇති ආර්ථික පියවර ගැනීමට හොඳින් සන්නද්ධව ඇති පුද්ගලයා ඔහු බව ඔවුන් සිතන නිසාය. එසේම ජෙනරාල්වරයා අවශ්‍ය දේ කුමක් දැයි වටහාගෙන සිටියි. ඔහු මෑතකදී ව්‍යාපාරික ප්‍රධානීන් හමුවේ මෙසේ පැවසීය. "මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකාවට අවශ්‍යව ඇත්තේ, විනයගත, කැපවූ, අවංක, දුර දිග දක්නා හා නොබියව දැඩි තීන්දු ගන්නා නායකයෙකි." මෙම කෲර ජෙනරාල්වරයා "ප්‍රජාතන්ත්‍රවාදියෙකු" ලෙස වෙස් ගැන්වීමේලා, එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සියලු විරුද්ධ පක්ෂ දරන සියලු උත්සාහයන් නිර්ලජ්ජිත ප්‍රෝඩාවකි.

වෙනස්වූ දිශාවන් ගෙන් වුවත් දකුනු ආසියාව වටා කරකැවෙමින් ඇති ජාත්‍යන්තර එදිරිවාදීකම්වල මහා සුලිකුනාටුව තුලට මේ පුද්ගලයන් දෙදෙනා දිවයින ඇදගෙන යමින් සිටිති. රාජ්‍යතාන්ත්‍රික සහයෝගය, මුදල්, ආයෝජන හා අවි ආයුධ සඳහා රාජපක්ෂ වඩ වඩාත් චීනය හා එහි සගයන් මත රැඳී සිටියි. එක්සත් ජනපදය හා යුරෝපය විසින් සිය ආන්ඩුව මත බලපෑම් යෙදීමට දරන උත්සාහය "ජාත්‍යන්තර කුමන්ත්‍රනයක්" යයි ඔහුගේ හෙලාදැකීමට ලක්වෙයි. රටේ සම්ප්‍රදායික බැඳීම් දෙදරුම්කෑම පිලිබඳව ගැඹුරින් ම කනස්සල්ලට පත්ව සිටින පාලක පැලැන්තියේ කොටස් වෙනුවෙන් ෆොන්සේකා කථා කරයි. ව්‍යාපාරික ප්‍රධානීන් අමතමින් ඔහු, "බටහිර විරෝධී ආතතිය අවුලුවමින් ද රටේ ආර්ථික ප්‍රගතිය අවුල් කිරීම සඳහා බටහිර රටවල් පෙලගැසී සිටින්නේ යයි හුවාදැක්වීමට ද" උත්සාහ කිරීම පිලිබඳව රාජපක්ෂට පහර ගැසීය.

ඒ හෝ මේ කොල්ලකාරී බලවතුන් පිටුපස පෙල ගැසීමෙන් කිසිදු සාධනීය යමක් අත් කර ගත නො හැකිය. එක්සත් ජනපදය දැනටමත් කලාපය තුල සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා පෙරටු කර ගෙන ඇෆ්ගනිස්ථානය හා ඉරාකය තුල යුද්ධයන්හි යෙදී සිටින අතර පකිස්ථානය සිවිල් යුද්ධයක් තුලට දක්කමින් සිටියි. චීනය, මැදපෙරදිග,

මධ්‍යම ආසියාව, අප්‍රිකාව හා ජාත්‍යන්තරව සිය අමුද්‍රව්‍ය හා බලශක්ති සැපයුම ස්ථාවර කරගැනීමේ ව්‍යායාමයක නිරතව සිටියි. ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය කලාපය පුරා විසිර සිටින සිය පන්ති සහෝදරයන් හා සහෝදරියන් සමග එක්ව මේ සියලු යටිකුට්ටු, උපාමාරු හා යුද්ධයන්ට එරෙහිව නැගී සිටිය යුතුය.

අනෙක් සියලු පක්ෂ රාජපක්ෂ හා ෆොන්සේකා පිටුපස පෙලගැසී සිටිති. වතුකරයේදී, ලංකා වතු කම්කරු සංගමය හෙවත් සීඩබ්ලිව්සී හා කඳුරට ජනතා පෙරමුන ද ඇතුලු සියලු සමිති රාජපක්ෂට හෝ ෆොන්සේකාට සහාය දෙන්නේ ජය ගැනීමෙන් පසු තමන්ට ඇමතිකම් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි.

කලින් එල්ටීටීඊ හොරනෑව ලෙස කටයුතු කල දෙමල ජාතික සන්ධානය එල්ටීටීඊයට එරෙහිව නිර්දය ලෙස ප්‍රහාර එල්ල කල පුද්ගලයා වන ෆොන්සේකා වෙත සිය පක්ෂපාතිත්වය පුදකර ඇත. අංශක 180ක අසාමාන්‍ය කරනමක් ගසමින් ටීඑන්ඒ දැන් කියා සිටින්නේ, ජෙනරාල්වරයා දෙමල ජනතාවගේ ගැටලු වලට සානුකම්පිතව සවන් දෙනු ඇති බවයි. ඔවුන් මේ සියලු කැත බඩගෑම්වල යෙදෙන්නේ කොලඹ දේශපාලන සංස්ථාපිතය තුල ටීඑන්ඒයට ඉඩක් සහතික කර ගැනීම සඳහාය.

අන් සියල්ලටමත් වඩා එල්ටීටීඊ මිලිටරි පරාජය වනාහි, වෙනම ධනේශ්වර දෙමල රාජ්‍යයක් සඳහාවූ එහි ඉදිරිදර්ශනයෙහි දේශපාලන බංකොලොත් කමේ ප්‍රතිඵලයයි. කම්කරු පන්තිය බෙදීමට උදව්වූ එහි වාර්ගික දේශපාලනය, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමෝපායන් හා සිවිල් ජනතාවට එල්ල කල ත්‍රස්තවාදී ප්‍රහාර නිසා සිංහල පමනක් නොව දෙමල මහජනතාව වෙතින් ද එල්ටීටීඊය හුදෙකලා වුනි. දෙමල කම්කරුවන් හා තරුනයන් සඳහා වෙනම විසඳුමක් ඇත්තේ නැත. දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් දිනාගත හැක්කේ ධනවාදය අහෝසි කිරීම සඳහා කම්කරු පන්තියේ එකාබද්ධ අරගලයක කොටසක් ලෙස පමනි.

නව සමසමාජ පක්ෂයේ (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂයේ (යූඑස්පී) හිටපු වම්මු ද වෙනම අපේක්ෂකයන් ඉදිරිපත්කොට ඇත්තේ, වඩාත් හිතන මතන කම්කරුවන් හා තරුනයන් පාලක පන්තියේ ඒ හෝ මේ කන්ඩායමට බැඳ දැමීම සඳහා ය. යූඑස්පී අපේක්ෂක සිරිතුංග ජයසූරිය මෑතකදී එජාපයේ ප්‍රෝඩාකාරී "නිදහසේ වේදිකාවට" නැගගනිමින්, මෙම දක්ෂිනාංශික පක්ෂය හා එහි අපේක්ෂක ෆොන්සේකා ද ප්‍රජාතන්ත්‍රවාදීන් ලෙස වෙස්ගැන්වීමට උදව් කලේය. නසසප වෙනත් මඟක් ගනිමින් සිය සහයෝගය ටීඑන්ඒ වෙතින් කැඩීගිය, ධනවාදය යටතේ දෙමල ජනතාවට වෙනම විසඳුමක් ඇතැයි යන අන්තරායකාරී මිථ්‍යාව යලි පනගැන්වීමට උත්සාහකරන අයෙකු පිටුපස පෙල ගැසී ඇත.

නපුරු බලවේග දෙකෙන් අඩු නපුර රාජපක්ෂ නැත්නම් ෆොන්සේකා යයි ඒත්තුගැන්වීම මගින් තමන් මුලාකිරීමට දරන සියලු ප්‍රයත්නයන් කම්කරුවන් විසින් ප්‍රතික්ෂේප කල යුතුය. රුදුරු සත්‍යය නම්, වැඩකරන ජනතාව මුහුනදී සිටින කිසිදු ප්‍රශ්නයකට මේ මැතිවරනයෙන් විසඳුම් නොලැබෙන බවයි. නිදහසෙන් පසු ගතවූ හැට වසරක වාර්තාව, සමස්ත ධනේශ්වරයටම එරෙහි චෝදනා පත්‍රයකි. ධනේශ්වරය විසින් ලබාදී ඇත්තේ යුද්ධය, දුප්පත්කම හා අමු අමුවේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීම පමනි. දැන් ආර්ථික අර්බුදය උග්‍රවන තත්වය තුල, වාර්ගික යුද්ධය ගෙනගිය ඒ අයම සමස්ත වැඩකරන ජනතාවටම එරෙහිව "ආර්ථික යුද්ධයක්" දියත් කිරීමට සූදානම් වෙමින් සිටිති.

මේ මැතිවරනය තුල සසප උද්ඝෝෂනය කරන්නේ, ඉදිරියේදී එලඹෙන පන්ති සටන් සඳහා කම්කරුවන් හා තරුනයන් උගන්වා බලමුලු ගැන්වීම සඳහා ය. කම්කරු පන්තියට තමන්ගේ කුමන හෝ මූලික අයිතියක් රැකගත හැක්කේ, පාලක පන්තියේ සියලු පක්ෂවලින් තීරනාත්මකව කැඩී වෙන්වෙමින් තමන්ගේම

ශක්තිය මත විශ්වාසය තැබීමෙන් පමනි. සියලු වැඩකරන ජනතාවගෙන් අප ඉල්ලා සිටින්නේ, සමාජවාදී හා ජාත්‍යන්තරවාදී විකල්පයක් සඳහා තම දැනුවත් සහයෝගය හා සමස්ත දේශපාලන සංස්ථාපිතය හා එහි ප්‍රතිගාමී ක්‍රියාමාර්ගය කෙරෙහි තම විරුද්ධත්වය පලකිරීම සඳහා අපගේ අපේක්ෂක විජේ ඩයස්ට ඡන්දය දෙන ලෙසයි.

විජේ ඩයස්, සසප ප්‍රධාන ලේකම් මෙන්ම *ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙක් ද වෙයි. සසප පූර්වගාමී සංවිධානයවූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ආරම්භක සාමාජිකයෙකු ලෙස ඔහු පක්ෂයේ දශක හතරක සප්‍රතිපත්තික අරගලය මූර්තිමත් කරයි. විසිහය වසරක යුද්ධයට අශමනීය ලෙස විරුද්ධවූ ද උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම හමුදා ඉවත්කරගත යුතු බව ද කියා සිටි එකම පක්ෂය සසප පමනි.

මිලිටරි වාඩිලෑම වහාම අවසන් කිරීම, සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම, සියලු මර්දනකාරී අන පනත් අහෝසි කිරීම කල යුතු බව සසප කියා සිටියි. අපගේ නියෝජිතයා පදනම් වන්නේ, පාර්ලිමේන්තු උපාමාරු දැමීම් මත නොවේ. සමාජවාදී ආකාරයකට සමාජය ප්‍රතිව්‍යුහගත කරන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ පොදු අරගලයක් තුල, කම්කරු පන්තිය හා ගොවි ජනතාව ස්වාධීනව බලමුලුගැන්වීම මත ඔහු පිහිටා සිටියි. දකුනු ආසියාවේත් ජාත්‍යන්තරවත් සමාජවාදය සඳහා පුලුල් අරගලයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අප කරන කැඳවුමෙහි අර්ථය එයයි.

සසපට ඡන්දය දෙන ලෙසත්, අපගේ මැතිවරන ප්‍රකාශනය හදාරන ලෙසත්, දකුනු ආසියාවේත් ශ්‍රී ලංකාවේත් කම්කරු පන්තියේ මහජන පක්ෂය ලෙස සසප ගොඩනැඟීමට එක්වන ලෙසත් අපි කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටිමු.

පහත සඳහන් ලිපි ලේඛන ද කියවන්න,

2010 ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය සඳහා සසප ප්‍රකාශනය

සමාජ සමානතාවය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා සටන් වැදීමට සමාජවාදී ක්‍රියාමාර්ගයක් (2010 ජනවාරි 4)

.

© www.wsws.org